# වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විමර්ශන නිලධාරී, විමර්ශන නිලධාරී (නීති කටයුතු) සහ විමර්ශන නිලධාරී (තොරතුරු තාක්ෂණ) තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්වලින් කාර්යශීලී, උද්‍යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## විමර්ශන නිලධාරී තනතුර (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මඟපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 23 වගන්තිය යටතේ නිර්මාණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයේ සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ විමර්ශන කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්මය / වැවිලි කළමනාකරණය/ තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම යන විෂයයන් සම්බන්ධයෙන් ලබාගත් ප්‍රථම උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

## විමර්ශන නිලධාරී (නීති කටයුතු) (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මඟපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන, 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 23 වගන්තිය යටතේ නිර්මාණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයේ සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ විමර්ශන කටයුතුවලට අදාළ නීති කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීති උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස දිවුරුම් දී තිබීම.

## විමර්ශන නිලධාරී (තොරතුරු තාක්ෂණ) (MA 5-2) II ශ්‍රේණිය

**රැකියා පිරිවිතරය**

බලයලත් නිලධාරියෙකුගේ මඟපෙන්වීම හා අධීක්ෂණයට යටත්ව 1957 අංක 51 හා 1959 අංක 16 දරන තේ පාලන පනතේ ප්‍රතිපාදන 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතියෙහි 23 වගන්තිය යටතේ නිර්මාණය කර ඇති රෙගුලාසි අනුව තේ කර්මාන්තයේ සංවර්ධන හා නියාමන කටයුතුවලට අදාළ තොරතුරු තාක්ෂණ කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද : (බාහිර සහ අභ්‍යන්තර අයදුම්කරුවන්)**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය **සහ** අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

**වැටුප් පරිමාණය**

MA 5-2-2016 රු. (36,850-10X755-15X930-5X1,135-64,025)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව ආරම්භක මාසික වැටුප් පියවර 36,850/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

**වයස් සීමාව**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපවත්වනු ඇත.

**තෝරා ගැනීම**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්.

**පොදු කොන්දේසි :**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් යුතු පුද්ගලයින් විය යුතුය.
- තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදු කරනු ලැබේ.
- සියලුම තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

**වෙනත් ප්‍රතිලාභ**

- මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලයේ ඒ සඳහා 15% ක් දායක වනු ඇත.
- මණ්ඩලය සේවානියුක්තයින්ගේ සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 3% ක් දායක වනු ඇත.

**අයදුම් කිරීම :**

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2021 අප්‍රේල් 21** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි. ප. ත. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**574, ගාලු පාර, කොළඹ 03.**